නැගෙනහිර පළාත් සභාව - 2019

------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

---------------

### 1.1 තත්ත්වාගණනය කළ මතය

---------------------------------

නැගෙනහිර පළාත් සභාවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) උපවගන්තිය ප්‍රකාරව සහ පළාත් සභා පනතේ 23(2) වගන්තිය ප්‍රකාරව සම්පිණ්ඩන වාර්තාව 2020 අගෝස්තු 19 දින නිකුත් කරන ලදි. විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 අගෝස්තු 20 දින නිකුත් කරන ලදි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු ජාතික විගණන පනතේ 10(1) උප වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කරන ලද මතය සඳහා වන පදනම යන ඡේදයේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, නැගෙනහිර පළාත් සභාවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---------------------------------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

පළාත් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සඳහා පළාත් භාණ්ඩාගාරය ඇතුළු විවිධ පළාත් ආයතනවල කළමනාකරණය වගකීම දරයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව නැගෙනහිර පළාත් සභාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම,

චේතනාන්විත මගහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාචෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස නැගෙනහිර පළාත් සභාවේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්ති වල යෝග්‍යතාවය සහ ගිණුම්කරණ ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ ගිණුම්කරන හෙළිදරව් කිරීම් සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳ පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නැගෙනහිර පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප බව.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරන අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවට විරුද්ධව තෙවන පාර්ශව විසින් ගොනුකරන ලද නඩු 47 ක් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශන වල පළාත් සභාව විසින් අසම්භව්‍ය වගකීම් හෙළිදරවු කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරවු කිරීමට කටයුතු කළ යුතුයි | වර්තමානයේ පළාත් සභාව මුදල් පදනම් කර ගත් ගිණුම්කරන පද්ධතිය පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන සකස් කර තිබේ. කෙසේ වුවත්, අනාගතයේදී මූල්‍ය ප්‍රකාශන තුල අසම්භව්‍ය වගකීම් හෙළිදරවු කිරීමට කටයුතු කරනු ලැබේ. |

## 2. ආදායම් කළමනාකරණය

### 2.1 නැගෙනහිර පළාතේ මුද්දර බදු පැනවීමේ අරමුණින් නිශ්චල දේපළ තක්සේරු කිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) මඩකලපුව හා අම්පාර යන දිස්ත්‍රික්කවල වත්කම් වල අගය අඩු කර දැක්වීම මත එකතුව රු.42,136,021 ක අමතර මුද්දර ගාස්තුවක් පළාත් ආදායම් දෙපාර්තමේන්තුව විසින් රැස්කරගෙන තිබුණි. කෙසේ වෙතත්, 2014 සිට තක්සේරුකරු විසින් ලබා දෙන ලද නව තක්සේරු අගයට දේපළ වල මුහුණත වටිනාකම සිට වෙනස් කරන ලෙස දෙපාර්තමේන්තුව විසින් ත්‍රිකුණාමලය, මඩකලපුව හා අම්පාර යන දිසත්‍රික්කවල ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල වලට දැනුම් දී නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ තක්සේරු වත්කම්වල පැරණි මුහුණත අගය වසර ගණනාවක් පුරා නොවෙනස්ව පැවතුණි. | ඉහත වෙනස්කම් පිළිබඳව ඉඩම් රෙජිස්ට්‍රාර් දැනුවත් කිරීමට කටයුතු කළ යුතු වේ. | දෙපාර්තමේන්තුව විසින් අමතරව රැස්කරගන්නා ලද මුද්දර ගාස්තු හා ඔප්පු වටිනාකම මත වන දඩය සම්බන්ධ තොරතුරු සියලු දිස්ත්‍රික් ඉඩම් රෙජිස්ට්‍රාර්වරු දැනුවත් කර තිබේ. |
| (ආ) නැගෙනහිර පළාතේ ඉඩම් රෙජිස්ට්‍රාර් හි ඉඩම් ලියාපදිංචි කිරීමෙන් මුද්දර ගාස්තු එකතු කිරීම සම්බන්ධව පළාත් ආදායම් දෙපාර්තමේන්තුව විසින් 2015 සට 2019 මැයි 31 දක්වා කාලය තුළ සිදු කරන ලද ජංගම සේවයට අනුව, මුද්දර ගාස්තු ලෙස අඩු මුදලක් ගෙවීම සඳහා ඉඩම් හිමියන් තම ඉඩම් | ආපසු අයකර ගැනීම සඳහා පළාත් ආදායම් කොමසාරිස්වරයා පත් කිරීමට පියවර ගත යුතුය. | හිඟ බදු අයකර ගැනීම අඛණ්ඩ ක්‍රියාවලියක් වන අතර හිඟ බදු අයකර ගැනීමට කටයුතු කරමින් පවති. |

සඳහා අඩු වටිනාකමක් ප්‍රකාශයට පත් කර ඇති බව අනාවරණය විය. එබැවින් අඩුතක්සේරු දේපල සඳහා එකතුව රු. 11,227,019 ක අතිරේක මුද්දර ගාස්තු හා දඩ මුදල් පනවා තිබුණි. කෙසේවෙතත්, පළාත් ආදායම් කොමසාරිස්වරයකු පත් නොකිරීම හේතුවෙන් එම ඉඩම් අයිත්කරුවන් වෙත පැනවූ අතිරේක මුද්දර ගාස්තු නැවත අයකරගැනීම සඳහා පළාත් ආදායම් දෙපාර්තමේන්තුව 2020 ජුනි 30 දක්වාම කටයුතු කර නොතිබුණි.

## 2.2 මුද්දර ගාස්තු හා උසාවි දඩ අයකිරීම් කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) නැගෙනහිර පළාතේ ඉඩම් රෙජිස්ට්‍රාර් හි ඉඩම් ලියාපදිංචි කිරීමෙන් මුද්දර ගාස්තු එකතු කිරීම සම්බන්ධව පළාත් ආදායම් දෙපාර්තමේන්තුව විසින් 2017 සහ 2018 වර්ෂය තුළ සිදු කරන ලද ජංගම සේවයට අනුව, මුද්දර ගාස්තු ලෙස අඩු මුදලක් ගෙවීම සඳහා ඉඩම් හිමියන් 794 දෙනෙකු තම ඉඩම් සඳහා අඩු වටිනාකමක් ප්‍රකාශයට පත් කර ඇති බව අනාවරණය විය. එබැවින් අඩුතක්සේරු දේපල සඳහා රු.14,190,769 ක අතිරේක මුද්දර | ආපසු අයකර ගැනීම සඳහා පළාත් ආදායම් කොමසාරිස්වරයා පත් කිරීමට පියවර ගත යුතුය. | ආදායම් කොමසාරිස් තනතුර මේ දක්වාම පුරප්පාඩු වීම හේතුවෙන් දෙපාර්තමේන්තුව මගින් අයකර ගත යුතු අමතර මුද්දර ගාස්තු සම්බන්ධ ගැටළු සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට නොහැකි වී තිබේ. |

| | | |
|---|---|---|
| ගාස්තු පනවා ඇත. කෙසේවෙතත්, එම ඉඩම් අයිත්කරුවන් වෙත පැනවූ හිඟ ගාස්තු රු. 535,450 ක් නැවත අයකරගැනීම සඳහා පළාත් ආදායම් දෙපාර්තමේන්තුව 2019 දෙසැම්බර් 31 දක්වාම කටයුතු කර නොතිබුණි. | | |
| (ආ) ඉඩම් තක්සේරු නොකිරීම හේතුවෙන් අතිරේක මුද්දර ගාස්තු සත්‍යාපනය කිරීම සහ පැනවීම සඳහා 2012 සිට 2018 දක්වා කාලය තුළ නැගෙනහිර පළාතේ ලියාපදිංචි කර ඇති ඔප්පු හයදහස් විසිහයක් (6,026) පළාත් ආදායම් දෙපාර්තමේන්තුව විසින් තක්සේරු නොතිබුණි. | ඔප්පු පිළිබඳ තක්සේරු කිරීමේ කටයුතු කඩිනම් කිරීමට පියවර ගත යුතුය. | අඩු වටිනාකම් ඔප්පු කිරීම තකසේරු කිරීම සඳහා මානව සම්පත් හිඟකම දෙපාර්තමේන්තුව මුහුණ දෙන ප්‍රධාන බාධාවක් වී ඇති අතර, අම්පාර සහ මඩකලපුවෙහි ප්‍රාදේශීය කාර්යාල 2013 සිට වසා දමා තිබේ. එමනිසා ජංගම සේවා මගින් තක්සේරු ක්‍රියාවලිය සිදුකර ඇත. |

**2.3 හිඟහිටි ආදායම්**

---------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 09 ක රජයේ ඉඩම් වලට අදාලව රු.333,065,744 ක කල්බදු ආදායම් 1991 වර්ෂයේ සිට හිඟහිටව පැවතුනි. කෙසේවෙතත්, 2020 ජුනි 30 දින දක්වාම එම හිඟආදායම් අයකර ගැනීමට කඩිනම් පියවර ගෙන නොතිබුණි. | හිඟ කල්බදු ආදායම් අයකර ගැනීමට කඩිනම් පියවර ගත යුතුය. | මෙම එකතු වූ හිඟ වටිනාකම වන රු.333,065,744 තුල වාර්ෂිකව ඉදිරියට ගෙන එනු ලැබූ ශේෂය මත පනවන දඩ මුදලද ඇතුලත්ව තිබේ. |

| | | |
|---|---|---|
| (ආ) පළාත් ආදායම් දෙපාර්තමේන්තුව පිහිටුවා වසර 11 ක් ගතවී ඇතත්, නැගෙනහිර පළාතේ ක්‍රියාත්මක වන උකස් මධ්‍යස්ථාන ලියාපදිංචි කිරීමට හා මේ සම්බන්ධයෙන් වාර්ෂික බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා ප්‍රඥප්තියක් බලාත්මක කර නොතිබුණි. මෙහි ප්‍රතිඵලයක් ලෙස පළාත් සභාවට ආදායමේ සැලකිය යුතු මුදලක් අහිමි වී තිබුණි. | උකස් මධ්‍යස්ථාන සඳහා පළාත් ප්‍රඥප්තිය බලාත්මක කිරීමට කටයුතු කළ යුතුය. | උකස් මධ්‍යස්ථාන සඳහා ප්‍රඥප්තියයක් භාෂා 3න් කෙටුම්පත් කර ඇති අතර සභාව ආරම්භ වූ පසු ප්‍රඥප්තිය ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ පළාත් සභාවේ මෙහෙයුම් කටයුතු වලින් ලද අතිරික්තය රු. 1,152,988,235 ක් වූ අතර ඉකුත් වර්ෂය සමග සැසඳීමේ දී ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 1,708,421,018 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු. 555,432,783 ක පිරිහීමක් පෙන්නුම් කෙරිණි. සමාලෝචිත වර්ෂයේ වැටුප් හා වේතන රු. 1,429,917,032 න් ඉහළ යාම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි

## 4. ප්‍රඥප්ති ගිණුම්

### 4.1 නැගෙනහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) අධිකාරියේ කාර්යාලය සඳහා නැගෙනහිර පළාතේ මාර්ග මගී ප්‍රවාහන අධිකාරිය විසින් 2011 වර්ෂයේදී අධිකාරියේ අරමුදලෙන් කල්මුනේ බස් නැවතුම්පොළ සඳහා කල්මුන මහ නගර සභාව විසින් වෙන් කරන ලද ඉඩමක රු.2,405,942 ක වියදමින් ගොඩනැගිල්ලක් ඉදිකර තිබුණි. කෙසේ වෙතත්, කල්මුන මහ | වත්කම නැවත ලබාගැනීමට කටයුතු කළ යුතුය. | මෙම ගොඩනැගිල්ල අප වෙත පවරන මෙන් කිහිප වතාවක්ම කල්මුන මහ නගර සභාවෙන් අප ඉල්ලීම් කර ඇත. අවාසනාවකට තවමත් ඔවුන් විසින් මෙම ගොඩනැගිල්ල අප අධිකාරිය වෙත භාරදීමට කටයුතු කර නොමැත. |

| | | |
|---|---|---|
| නගර සභාව විසින් ගොඩනැගිල්ලේ අයිතිය ඉල්ලා ඇති අතර එය පෞද්ගලික බැංකුවකට කුලියට දී තිබේ. මේ හේතුවෙන් අධිකාරිය විසින් මෙම ගොඩනැගිල්ල ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. | | |
| (ආ) නැගෙනහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය විසින් බස් පර්යන්ත වෙත බස්රථ ලඟාවීම හා පිටවීම පටිගත වන සාමාන්‍ය පැකට් ගුවන් විදුලි සේවය (GPRS) සහිතව විකුණුම් උපකරණ (POS) 13 ක් සහ ටිකට් රෝල් 2000 ක් 2015 ජුනි 08 දින රු. 1,142,000 ක පිරිවැයකට මිලදී ගෙන තිබුණි. කෙසෙවෙතත්, මෙම මැෂින් ක්‍රියාත්මක කිරීමට විධිමත් මෘදුකාංග පද්ධතියක් නොමැති වීමෙන් අදාල අරමුණ උදෙසා වසර 5ක් භාවිතා තර නොතිබුණි. | විකුණුම් උපකරණ ක්‍රියාත්මක කිරීම සඳහා මෘදුකාංග පද්ධතිය ස්ථාපිත කිරීමට නොපමාව කටයුතු කළ යුතුය. | දැනට පද්ධතිය පරීක්ෂණ කාලයක් යටතේ ක්‍රියාත්මක වේ. මෙම පරීක්ෂණ කාලය අවසන් වීමෙන් පසු මෘදුකාංගය විධිමත්ව ක්‍රියාත්මක වුවහොත් ඉදිරියේදී මෙම විකුණුම් උපකරණ (POS) 13 දිස්ත්‍රික්ක 3 පුරා ක්‍රියාත්මක කළ හැකි වේ. |
| (ඇ) අම්පාර, අක්කරයිපත්තු සිට ත්‍රිකුණාමලය දක්වා වූ බස් රථ 13 ක් සඳහා මාර්ග අවසර පත්‍ර නිකුත් කර තිබුණද, අධිකාරිය විසින් කාලසටහන් සකස් කර ඇත්තේ බස් 09 ක් සඳහා පමණි. මාර්ග බලපත්‍ර නිකුත් කළ බස් රථ 13 න්, සමාලෝචිත වර්ෂය තුළ මහජනයාට ප්‍රවාහන සේවා ලබා දී ඇත්තේ බස්රථ 06 ක් පමණි. | බලපත්‍ර කොන්දේසියට අනුකූලව බස් රථ ධාවනය කිරීමට පියවර ගත යුතුය. | අම්පාර, අක්කරයිපත්තු සිට ත්‍රිකුණාමලය දක්වා වූ බස් රථ 13 ක් සඳහා අධිකාරිය විසින් කාලසටහන් නිකුත් කර ඇති බව සත්‍ය වේ. නමුත් සමාලෝචිත වර්ෂය තුළ සමහර බලපත්‍රලාභී හිමිකරුවන් බස් රථ යොදවා නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ)ISO 9001: 2015 ප්‍රමිතිය මත පදනම්ව ඵලදායී තත්ත්ව කළමනාකරණ පද්ධතියක් ස්ථාපනය කිරීම සඳහා අධිකාරිය විසින් රු.1,000,000 ක වටිනාකමට 2016 සැප්තැම්බර් 16 දින පෞද්ගලික සමාගමක් සමඟ ගිවිසුමක් අත්සන් කර තිබුණි. ඉන් රු.326,000 ක් 2019 දෙසැම්බර් 31 දින වන විට වියදම් කර තිබුණි. කෙසේ වෙතත්, අධිකාරිය අපේක්ෂා කළ පරිදි ISO සහතිකය 2020 ජුනි 30 දක්වාම ලබාගෙන නොතිබුණි. ඒ අනුව මෙම ව්‍යාපෘතියට වැය කළ මුදල ඵලරහිත වී තිබුණි. | තවදුරටත් ප්‍රමාදයකින් තොරව සහතික ලබා ගැනීමට පියවර ගත යුතුය. | අයදුම්පත පිළිගෙන ඇති බවත් පළමු විගණනය සඳහා අධිකාරිය වෙත පැමිණෙන බවත් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය අධිකාරියට දැනුම් දී තිබේ. |

## 4.2 නැගෙනහිර පළාත් පළාත් නිවාස අධිකාරිය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) නැගෙනහිර පළාත් ආණ්ඩුකාර ලේකම්ගේ අංක G/EPC/B/14/R/H හා 2014 ජුනි 20 දිනැති ලිපිය ප්‍රකාරව, පළාත් නිවාස අධිකාරිය ඒකාබද්ධ අරමුදල මත යැපීම වෙනුවට ස්වයං අරමුදල් උත්පාදනය කිරීමේ කොන්දේසිය මත 2014 වර්ෂයේදී වැටුප් හා අනෙකුත් වියදම් සඳහා අරමුදල් සපයා තිබුණි. කෙසේවෙතත්, අධිකාරිය පිහිටුවා වසර 5ක් ගතවී ඇතත්, වියදම් දැරීම සඳහා අරමුදල් උත්පාදනයට කිසිදු ව්‍යාපාරික කටයුත්තක් ආරම්භ කිරීමට අධිකාරිය සමත් වී නොතිබුණි. | ස්වයං මූල්‍ය අරමුදල් උත්පාදනයට නොපමාව කටයුතු කළ යුතුවේ. | මෙම ව්‍යාපාරයේ ආයෝජනය කිරීමට ප්‍රාග්ධනයක් නොමැතිකම නිසා මෙම අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය තීරණයක් ගෙන ඇතත් මේ දක්වා මෙම යෝජිත විකුණුම් මධ්‍යස්ථාන ස්ථාපිත කිරීමට නොහැකි වී ඇත. මීට අමතරව, කාර්යමණ්ඩල හිඟකම හේතුවෙන්ද මෙම අධිකාරියට එවැනි ක්‍රියාකාරකම්වල යෙදීමට හැකියාවක් නොමැත. |

| | | |
|---|---|---|
| (ආ) 2013 අංක 2 දරන නැගෙනහිර පළාත් නිවාස අධිකාරි පනතේ 1 (1) පරිච්ඡේදයේ 03 (3) වගන්තියට අනුව, යම් පුද්ගලයෙක් පළාත් පාලන ආයතනයේ සාමාජිකයෙකු වන්නේ නම්, ඔහු සභාපතිවරයෙකු ලෙස පත්වීමට සුදුසුකම් නොලබයි. කෙසේ වෙතත්, එම කාලය තුළ එරාවූර් එරාවූර් නගර සභාවට තේරී පත් වූ සාමාජිකයෙකු හා සභා රැස්වීම්වලට සහභාගී වූ පුද්ගලයෙකු ඉහත ප්‍රඥප්තියට පටහැනිව 2019 ජනවාරි 30 වන දින නැගෙනහිර පළාත් නිවාස අධිකාරියේ සභාපතිවරයා ලෙස පත් කරන තිබුණි. | ප්‍රඥප්තියට අනුකූල වීමට පියවර ගත යුතුය. | මෙම පත්වීම නැගෙනහිර පළාත් ගරු ආණ්ඩුකාර විසින් සිදු කරන ලදී. මෙම පත්වීම නැගෙනහිර පළාත් නිවාස අධිකාරියේ ප්‍රඥප්තියට පටහැනි බව පෙන්වා දෙමින් අධිකාරිය ප්‍රධාන අමාත්‍යාංශයේ ලේකම් හරහා ගරු ආණ්ඩුකාරවරයාට නිසි පරිදි දැනුම් දී ඇත. |
| (ඇ)නැගෙනහිර පළාත් නිවාස අධිකාරිය මගින් සකස් කර තිබූ නිවාස සංවර්ධන සැලැස්ම (2015-2019) ප්‍රකාරව, 2015 සිට 2019 කාලය තුල රු. මිලියන 14,525 ක ඇස්තමේන්තුගත පිරිවැයකින් නිවාස නොමැති පවුල් 29,700 කට නිවාස ඉදිකිරීමට අපේක්ෂා කර තිබුණි. කෙසේවුවත්, දේශීය නිශ්චිත සංවර්ධන පදාන යටතේ ප්‍රතිලාභීන්ට නිවාස ආධාර ලබා දීම හැර මෙම කාලය තුල කිසිදු නිවසක් ඉදිකර නොතිබුණි. | ස්වයං අරමුදල් සම්පාදනය කරමින් නිවාස සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක කිරීමට පියවර ගත යුතුය. | නැගෙනහිර පළාත් නිවාස අධිකාරිය (EPHA) මෙම සැලැස්ම සකස් කර පළාත් සැලසුම් ලේකම් කාර්යාලය හරහා මුදල් කොමිෂන් සභාවට අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී. කෙසේවෙතත්, පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රධාන යටතේ නැගෙනහිර පළාත් නිවාස අධිකාරිය වෙත රුපියල් මිලියන 48.61 ක් පමණක් ලැබී තිබුණු අතර එයින් අඩු ආදායම්ලාභී පවුල් සඳහා නිවසක් ඉදිකිරීම සඳහා ආධාර සැපයීම වෙනුවෙන් රුපියල් මිලියන 48.43 ක් ඵලදායී ලෙස භාවිතා කරන ලදී. අග්‍රිමය සම්පූර්ණයෙන්ම |

| | | |
|---|---|---|
| | | ලබා දුන්නේ නම්, තවත් ඉදිකිරීම් සිදු කිරීමට අධිකාරියට හැකිවනු ඇත. |
| (ඇ)අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ 2014/03/03 තීරණයට අනුව, නැගෙනහිර පළාතේ සංවර්ධන කටයුතු සිදුකරන කොන්ත්‍රාත්කරුට සිමෙන්ති බෙදා හැරීම සඳහා ටෝකියෝ සිමෙන්ති සමාගමෙන් සිමෙන්ති මිලදී ගැනීමට තීරණය විය. කෙසේ වෙතත්, ඉහත තීරණයට පටහැනිව, අධිකාරිය විසින් ඉහත සමාගමෙන් සිමෙන්ති මිල දී ගෙන ලාභ උපයා ගැනීම සඳහා උප නියෝජිතයින්ට විකුණා තිබුණි. එබැවිනි සමාගම විසින් අධිකාරියට සිමෙන්ති නිකුත් කිරීම නවතා තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස පළාත තුළ සංවර්ධන කටයුතු සිදු කිරීම සඳහා කොන්ත්‍රාත්කරුවන්ට සිමෙන්ති ලබා දීමට අධිකාරියට නොහැකි වී තිබුණි. | අධිකාරිය විසින්ම ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට පියවර ගත යුතුය. | දිස්ත්‍රික්ක තුනක ක්‍රියාත්මක කරන ලද නිවාස ව්‍යාපෘති සඳහා නැගෙනහිර පළාත් නිවාස අධිකාරිය (EPHA) විසින් ටෝකියෝ සිමෙන්ති සමාගම හරහා කොන්ත්‍රාත්කරුවන්ට අවශ්‍ය සිමෙන්ති සැපයීම සිදු කරන ලදී. පසුව, ටෝකියෝ සිමෙන්ති සමාගම කොන්ත්‍රාත්කරුවන්ට නොව නැගෙනහිර පළාත් නිවාස අධිකාරිය (EPHA) විසින් සෘජුවම ක්‍රියාත්මක කරන වැඩවලට සිමෙන්ති සැපයීමට එකඟ විය. ටෝකියෝ සිමෙන්ති සමාගම සිමෙන්ති සැපයීම නැවැත්වීමට හේතු වූ එකම හේතුව මෙයය වේ. |
| (ඉ)අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ 2014/03/03 තීරණයට අනුව, අධිකාරිය විසින් සිදු කරනු ලබන සංවර්ධන කටයුතු සඳහා සිමෙන්ති ගඩොල් නිෂ්පාදනය කිරීම සඳහා පළාත තුළ නිෂ්පාදන මධ්‍යස්ථාන 10 ක් පිහිටුවීමට තීරණය කරන ලද අතර සිමෙන්ති ගඩොල් 1,200,000 ක් නිෂ්පාදනය කිරීමෙන් වසරකට රු.4,322,510 ක ලාභයක් උපයා | නිෂ්පාදන මධ්‍යස්ථාන ආරම්භ කිරීමට පියවර ගත යුතුය. | එවැනි ඒකක පිහිටුවීමට සහ සිමෙන්ති ගල් නිෂ්පාදනය කිරීම සඳහා අවශ්‍ය යන්ත්‍රෝපකරණ මිලදී ගැනීමට අවශ්‍ය මූලික ප්‍රාග්ධනය පළාත් සභාව විසින් සපයනු නොලබන හෙයින් එය සිදු නොවීය. |

ගැනීමට අපේක්ෂා කරන ලදී. කෙසේ වෙතත්, 2019 දෙසැම්බර් 31 දක්වා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

## 4.3 නැගෙනහිර පළාතේ පෙර පාසල් අධ්‍යාපන කාර්යාංශය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| යුනිසෙෆ් ආයතනය සමග පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද පෙර පාසල් ගුරුවරුන් සඳහා අවම ප්‍රමිතීන් සම්බන්ධ ප්‍රතිපත්ති මාර්ගෝපදේශයට අනුව ගුරුවරුන් අනිවාර්යයෙන් පෙර පාසල් අධ්‍යාපනය පිළිබඳ අනුමත ඩිප්ලෝමා පාඨමාලාවක් සම්පූර්ණ කර තිබිය යුතුය. කෙසේ වෙතත්, පෙර පාසල් ගුරුවරුන් 1515 ක් 2020 ජුනි 30 දක්වා ඩිප්ලෝමා පාඨමාලා සම්පූර්ණ කර නොතිබුණි. | ඩිප්ලෝමා පාඨමාලා සම්පූර්ණ කිරීම දිරිගැන්වීමට කටයුතු කළ යුතුය. | පෙර පාසල් ගුරුවරුන් අනුමත ඩිප්ලෝමා පාඨමාලාව සම්පූර්ණ කළ යුතු බවට ප්‍රඥප්තියේ සඳහන් වුවද, මූල්‍ය බාධාව ගුරුවරුන්ට මෙම ඩිප්ලෝමා පාඨමාලාව සම්පූර්ණ කිරීමට බාධාවක් වී ඇති අතර විශ්වවිද්‍යාලවල මෙම පාඨමාලාවට රු.75,000.00 ක් පමණ වැය වන බැවින් ගුරුවරුන් තම අධ්‍යයන කටයුතු සඳහා අරමුදල් සෙවීමේ දුෂ්කරතාවයන්ටද මුහුණ දී සිටිති. |

## 4.4 නැගෙනහිර පළාත් සංචාරක කාර්යාංශය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2016 අංක 1 දරන නැගෙනහිර පළාත් සංචාරක කාර්යාංශ පනතේ 11(A) වගන්තියට අනුව, යම් පුද්ගලයෙක් පළාත් පාලන ආයතනයේ සාමාජිකයෙකු වන්නේ | ප්‍රඥප්තියට අනුකූල වීමට පියවර ගත යුතුය. | කාර්යාංශයට සභාපති ධූරය සඳහා ගරු ආණ්ඩුකාරවරයා විසින් ලබා දී ඇති පත්වීමට අනුව නැගෙනහිර පළාත් සංචාරක කාර්යාංශය ඒ පිළිබඳව ලිඛිතව දන්වා ඇත. |

නම්, ඔහු කාර්යාංශයේ සභාපතිවරයෙකු ලෙස පත්වීමට සුදුසුකම් නොලබයි. කෙසේ වෙතත්, එම කාලය තුළ අම්පාර නගර සභාවට තේරී පත් වූ සාමාජිකයෙකු හා සභා රැස්වීම්වලට සහභාගී වූ පුද්ගලයෙකු ඉහත ප්‍රඥප්තියට පටහැනිව 2019 ජනවාරි 30 වන දින නැගෙනහිර පළාත් සංචාරක කාර්යාංශයේ සභාපතිවරයා ලෙස පත් කරන තිබුණි.

## 5. මෙහෙයුම් සමාලෝචනය

### 5.1 කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ)2008 අප්‍රියෙල් 21 දිනැති අධ්‍යාපන අමාත්‍යාංශයේ චක්‍රලේඛ අංක 2008/12 ට අනුව ද්වි-මාධ්‍යයෙන් ඉගෙන ගන්නා සිසුන් සඳහා වෙනම පන්තියක් නොතිබිය යුතු අතර ඔවුන් සිංහල හෝ දෙමළ මාධ්‍ය සිසුන් සමඟ මිශ්‍ර කළ යුතුය. තවද, අදාළ විෂය ඉංග්‍රීසියෙන් ඉගෙන ගන්නා විට ඔවුන් වෙන් කළ යුතුය. කෙසේ වෙතත්, ඉහත චක්‍රලේඛයට පටහැනිව ද්විභාෂා අධ්‍යාපනය සඳහා කින්නියා අධ්‍යාපන කලාපයේ පාසල් 06 ක වෙනම පන්ති 20 ක් පිහිටුවා | අධ්‍යාපන අමාත්‍යාංශයේ චක්‍රලේඛ අංක 2008/12 ප්‍රකාරව පියවර ගත යුතුය. | අධ්‍යාපන අමාත්‍යාංශයේ අංක 2008/12 චක්‍රලේඛයට අනුව දැනට ද්විභාෂා අධ්‍යන කටයුතු සිදු කරන අතර, මේ සම්බන්ධයෙන් වැඩි අවධානයක් යොමු කිරීමට පියවර ගන්නා බව මෙයින් සහතික කරන අතර, නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ - සංවර්ධන ඍජුවම අදාළ පාසල් වෙත පිවිසෙන බව දැනුම් දෙමි. |

| | | |
|---|---|---|
| තිබුණි. මේ සම්බන්ධයෙන් ද්විභාෂා සම්බන්ධීකාරක විසින් පන්ති අධීක්ෂණය කිරීමට පියවර ගෙන නොතිබුණි. | | |
| (ආ)කල්මුනයි අධ්‍යාපන කලාපයේ පාසල් 17 ක් තම පාසල්වල ප්‍රමිතිය සහ පළාත් ශ්‍රේණිගත කිරීම් පවත්වාගෙන යාම සඳහා කාර්යසාධනය අඩු සිසුන්ට අධ්‍යන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටීමට ඉඩ දී නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස සිසුන්ට කිසිදු අධ්‍යාපන සුදුසුකමක් නොමැතිව පාසල් හැර යාමට සිදු වී ඇති අතර මෙම ක්‍රියාව අදාළ සිසුන්ගේ උසස් අධ්‍යාපනයට අහිතකර ලෙස බලපානු ඇත. | ප්‍රවේශපත්‍ර ලබාදීම ප්‍රතික්ෂේප නොකර සිසුන්ට විභාගවලට පෙනී සිටීමට ඉඩ දීමට කටයුතු කළ යුතු යුතුය. | කල්මුනේ කලාපීය අධ්‍යාපන අධ්‍යක්ෂ පවසන පරිදි මෙම පාසල් 17 හි විදුහල්පතිවරුන් 2018 දී සමහර සිසුන්ට අධ්‍යන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටීමට ඉඩ දී නොතිබුණි. සමහර සිසුන් දීර්ඝ කාලයක් පාසැලට නොපැමිණි අය වන අතර, සමහර සිසුන් කලින් විවාහ වූ අතර සමහර සිසුන් ඔවුන්ම විභාගයෙන් ඉවත් විය. |

**5.2.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පෞද්ගලික සමාගමක් විසින් 2016 ජුනි මාසයේදී රු.5,283,600 ක වියදමින් මුතූර් මූලික රෝහලේ දහන යන්ත්‍රයක් ස්ථාපනය කර තිබුණි. කෙසේවෙතත්, දහන යන්ත්‍රය ස්ථාපනය කිරීමෙන් පසුව, රු.2,429,890 ක වියදමක් දරා අළුත්වැඩියාවක් සිදු කර ඇති බව නිරීක්ෂණය කරන ලදී. එනම් 2020 | එය ඉක්මනින් ස්ථාපනය කිරීමට පියවර ගත යුතුය. | පරිසර අධිකාරිය විසින් 2016 ජූලි මාසයේදී මුතූර්හි මූලික රෝහලේ දහන යන්ත්‍රය සවි කිරීම සඳහා මෙම ස්ථානය හඳුනාගෙන ඇත. මෙම දහන යන්ත්‍රෙය් උස අඩි 23 කි. නමුත් මූතූර් මූලික රෝහලේ නිල නිවාස වල උස අඩි 41 කි. එබැවින් දහන යන්ත්‍රයෙන් පිටවන දුම පරිසරයට බලපෑම් ඇති කරයි. |

මැයි දක්වා ස්ථාපනය කිරීමේ පිරිවැය මත යන්ත්‍රයේ පිරිවැයෙන් සියයට 46 වී ඇති බවයි.

**5.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

-----------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව, නැගෙනහිර පළාත් සභාවේ විෂය පථය යටතට ගැනෙන ආයතන වල නිලධාරීන් සඳහා සමාලෝචිත වර්ෂය තුල කාර්යක්ෂමතා කඩඉම් විභාග 36 ක් පැවැත්විය යුතුවේ. කෙසේවෙතත්, සමාලෝචිත වර්ෂය තුල කාර්යක්ෂමතා කඩඉම් විභාග 10 ක් පවත්වා නොතිබුණි. | කාර්යක්ෂමතා කඩඉම් විභාගය නියමිත කාලයේදී පැවැත්වීමට කටයුතු කළ යුතුවේ. | පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2019 සඳහා සැලසුම් කර ඇති කාර්යක්ෂමතා කඩඉම් විභාග 09 ක් පවත්වා නොතිබුණද, සැලසුම් කර නොතිබූ කාර්යක්ෂමතා කඩඉම් විභාග 08 ක් සහ බඳවා ගැනීමේ විභාග 07 ක් පවත්වා ඇත; එය අතිරේක විභාග 16 කි. |

**5.4 කාර්යමණ්ඩල පරිපාලනය**

---------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2008 අංක 01 මුදල් ප්‍රඥප්තියේ 2 වන වගන්තියට අනුව, පළාත් ආදායම් කොමසාරිස්වරයකු පත්කළ යුතුය. කෙසේ වෙතත්, පළාත් ආදායම් කොමසාරිස් ධුරය 2011 දෙසැම්බර් 18 සිට පුරප්පාඩු වී තිබුණද, නැගෙනහිර | පළාත් ආදායම් කොමසාරිස්වරයකු ස්ථිර ලෙස පත් කිරීමට පියවර ගත යුතුය. | ආදායම් දෙපාර්තමේන්තුවේ අනුමත සේවා ව්‍යවස්ථාව සහ බඳවා ගැනීමේ යෝජනාව අනුව සුදුසු පළාත් ආදායම් කොමසාරිස්වරයකු බඳවා ගැනීමට පියවර ගනු ලැබේ. |

පළාතේ පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ අනුමත සේවා ව්‍යවස්ථාව හා බඳවා ගැනීමේ යෝජනා ක්‍රමයේ 3.2 වගන්තිය ප්‍රකාරව පළාත් සභාව මෙම තනතුර පිරවීමට පියවර ගෙන නොතිබුණි.

## 5.5 අධ්‍යාපන අංශය පිළිබඳ නිරීක්ෂණ

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණකාධිකාරීගේ / ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) අධ්‍යාපන අමාත්‍යාංශයේ අංක 1998/23 හා 1998 ජූලි 06 දිනැති චක්‍රලේඛය ප්‍රකාරව කාර්ය සාධන විදුහල්පතිවරුන් පත් කළ හැක්කේ සුදුසුකම් ලත් විදුහල්පතිවරුන් පත් කරන තුරු පමණි. කෙසේ වෙතත්, ඉහත චක්‍රලේඛයට පටහැනිව ශ්‍රී ලංකා ගුරු සේවයේ ගුරුවරුන් 27 දෙනෙකු කින්නියා අධ්‍යාපන කලාපයේ කාර්යසාධන විදුහල්පතිවරුන් ලෙස සේවය කර තිබුණි. | අධ්‍යාපන අමාත්‍යාංශයේ අංක 1998/23 දරන චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් කින්නියා කළාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයා වෙත විධිමත් පරිදි උපදෙස් ලබා දී තිබේ |
| (ආ) විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව, ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරීන් 08 දෙනෙකු පාසැල් වගකීම් නොමැතිව පාසැල් වලට අනුයුක්ත කර තිබුණි. කෙසේවෙතත්, කින්නියා කළාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් | එම විදුහල්පතිවරුන් පුරප්පාඩු සහිත පාසැල් වලට මාරු කිරීමට කටයුතු කළ යුතුය. | පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් කින්නියා කළාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයා වෙත විධිමත් පරිදි උපදෙස් ලබා දී තිබේ. |

| | | |
|---|---|---|
| කළාපයේ විදුහල්පති පුරප්පාඩු 27 ක් පිරවීමට කටයුතු කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස දිවයිනේ අධ්‍යාපන කලාප සඳහා වන ශ්‍රේණිගත කිරීම් අනුව කලාපයේ අධ්‍යාපන ප්‍රමිතීන් ඉතා අඩු ප්‍රමිතීන් දක්වා අඩු කර තිබුණි. | | |
| (ඇ)අධ්‍යාපන අමාත්‍යාංශයේ අංක 20/2007 චක්‍රලේඛය ප්‍රකාරව වර්ෂ 08ක් සම්පූර්ණ කළ සියලු ගුරුවරුන් මාරු කළ යුතු වේ. කෙසේවෙතත්, කින්නියා අධ්‍යාපන කලාපයේ කාර්යසාධන විදුහල්පතිවරුන් ලෙස තාවකාලිකව සේවය කරන ගුරුවරුන් 27 දෙනෙකු අවුරුදු 08 සිට අවුරුදු 10 දක්වා වාර්ෂික මාරුවීම් වලට යටත් නොවීය. | අධ්‍යාපන අමාත්‍යාංශයේ අංක 20/2007 දරන චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් කින්නියා කළාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයා වෙත විධිමත් පරිදි උපදෙස් ලබා දී තිබේ. |
| (ඈ)සුවිශේෂී තත්වයක් මත ගුරුවරුන් තාවකාලික පදනමින් පාසල්වලට අනුයුක්ත කළ යුතු වුවද, කල්මුනයි අධ්‍යාපන කලාපයේ ගුරුවරුන් 21 දෙනෙකු වසර 02 සිට 07 දක්වා කාලයක් සඳහා ජාතික පාසල්වල සිට පළාත් පාසල්වලට අනුයුක්ත කර තිබුණි. තවද ඔවුන්ගේ වැටුප් ජාතික පාසැල් වැටුප් ලේඛණ මගින් ගෙවා තිබුණි. කෙසේ වෙතත්, එම තාවකාලික අනුයුක්ත කිරීම් අවලංගු කර සුදුසු පාසැල් වලට යොමුකිරීමට කටයුතු කර නොතිබුණි. | තාවකාලික අනුයුක්ත කිරීම් නතර කිරීමට කටයුතු කළ යුතුවේ. | මෙම ගුරුවරුන් ප්‍රාථමික විෂය ගුරුවරුන් වේ. ඔවුන්ගේ ස්ථිර පාසැල්, පාසැල් 1000 ව්‍යාපෘතිය යටතට පැමිණෙන බැවින් නැවත ඔවුන් පාසැල් 1000 ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන පාසැල් වලට මාරු කළ නොහැක. ඊට අමතරව, කල්මුණේ කළාපයේ සුදුසු පාසැල්ද නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඉ) ලබා දී ඇති තොරතුරු අනුව, ප්‍රාථමික මට්ටමේ, විද්‍යාව හා ඉංග්‍රීසි යනාදී ප්‍රධාන විෂයන් වලට අදාලව ගුරුවරුන් 472 කගේ අතිරික්තයක් වාර්තා වී තිබුණි. කෙසේවෙතත්, කල්මුනෙයි කළාප අධ්‍යාපන කාර්යාලය විසින් ගුරු පුරප්පාඩු 272 ක් වාර්තා වී ඇති පාසැල් වලට හෝ පිටත කළාප වලට ඔවුන් මාරු කර කාර්යමණ්ඩලය තුලනය කිරීමට කටයුතු කර නොතිබුණි. | ගුරු කාර්යමණ්ඩලය ස්ථිරව පවත්වා ගැනීමට කටයුතු කළ යුතු වේ. | නැගෙනහිර පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය හා නැගෙනහිර පළාත් පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් කළාප අතර කාර්යමණ්ඩලය තුලනය කිරීමට අඛණ්ඩව කටයුතු කරමින් පවති. |
| (ඊ) අධ්‍යාපන අමාත්‍යාංශයේ අංක 20/2007 හා 2007 දෙසැම්බර් චක්‍රලේඛය ප්‍රකාරව වර්ෂ 08ක් සම්පූර්ණ කළ ගුරුවරුන් මාරු කළ යුතු වේ. කෙසේ වෙතත්, කල්මුනෙයි අධ්‍යාපන කළාපයට අනුයුක්ත ශ්‍රී ලංකා ගුරු සේවයේ ගුරුවරුන් 311 දෙනෙකු මාරු කිරීමකින් තොරව වසර 08 සිට 15 ක කාලයක් එම පාසැල් වලම සේවයේ යොදවා තිබුණි. මේ අනුව කළාපය විසින් විධිමත් මාරුකිරීම් ප්‍රතිපත්තියක් අනුගමනය කර නොමැති බව නිරීක්ෂණය විය. | අධ්‍යාපන අමාත්‍යාංශයේ අංක 20/2007 දරන චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | නැගෙනහිර පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය හා නැගෙනහිර පළාත් පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් කළාප අතර කාර්යමණ්ඩලය තුලනය කිරීමට අඛණ්ඩව කටයුතු කරමින් පවති. |